අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112785818
info@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.: ED/05/67/37/06(වා.ස්.මා 2026)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.:
දිනය / திகதி / Date: 2025.11. 13

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
ජාතික පාසල් විදුහල්පතිවරුන්
අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්වීම් ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු තීරණ - 2026**

උක්ත ශීර්ෂයෙන් යුතුව මවිසින් නිකුත් කරන ලද අංක 24/2025 හා 2025.06.27 දිනැති අධ්‍යාපන චක්‍රලේඛය ප්‍රකාරව සිදුකරන ලද, මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම් 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි.

02. එකී උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම් පිළිබඳව අදාළ සියලු නිලධරයන් දැනුවත් කළ යුතු අතර 2026.01.01 වන දින අභිනව සේවා ස්ථානයේ වැඩ භාර ගැනීමට හැකිවන පරිදි එකී නිලධරයින් ඔවුන්ගේ අනුප්‍රාප්තික නිලධරයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන විධිමත් පරිදි රාජකාරී කටයුතු වලින් මුදා හැරිය යුතුය

03. මෙම ස්ථාන මාරු නියෝගවලට යටත් නිලධරයෙකුට මෙතෙක් ක්‍රියාත්මක නොවූ, මීට ඉහතදී නිකුත්කර ඇති ස්ථාන මාරු නියෝගයක් වේ නම්, එවැනි නිලධරයන්ට නැවත 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් වෙනත් ස්ථාන මාරු නියෝගයන් ලබා දී ඇත්නම්, එහිදී පෙර ස්ථාන මාරු නියෝගය බල රහිත සේ සලකා ඔවුන් සම්බන්ධව කටයුතු කළ යුතුය.

04. ඉහත ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අංක 24/2025 දරන අධ්‍යාපන චක්‍රලේඛයෙහි 09 වන වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර, ඒ පිළිබඳව ස්ථාන මාරු ලැබූ නිලධරයන් දැනුවත් වීම කළ යුතුය. මෙම ස්ථාන මාරුවීම් නියෝග පැහැර හරිනු ලබන නිලධරයන් සම්බන්ධයෙන් අංක 24/2025 දරන අධ්‍යාපන චක්‍රලේඛයේ 09 (VIII) වගන්තිය අනුව කටයුතු කළ හැකි බව දන්වමි.

05. ඉහත සඳහන් අංක 24/2025 දරන අධ්‍යාපන චක්‍රලේඛයෙහි හෝ එකී චක්‍රලේඛයට යා කර ඇති අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි හෝ අංක 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති - 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව සහ ඉහත කී අංක 24/2025 දරණ අධ්‍යාපන චක්‍රලේඛයෙහි 07 (I) ඡේදයෙහි සඳහන් පරිදි, තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව වාර්ෂික ස්ථාන මාරු කමිටුවෙහි අවධානය යොමු වී නොමැත්තේ නම් පමණක් වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත කරුණු ඉදිරිපත් කළ හැකිය. එකී කරුණු ඉදිරිපත් කිරීම් (ඉල්ලීම්) මෙයට ඇමුණුම 01 වශයෙන් අමුණා ඇති ආකෘතිය අනුව සකසා 2025.12.03. දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ. **ඇති විය හැකි ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත ලැබෙන අභියාචනා ඉල්ලීම් අවසාන දිනය තෙක් නොසිට, එම ඉල්ලීම් ලද වහාම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ආයතන ප්‍රධානීන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.**

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

06. ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව මගින් ලබා දෙනු ලබන තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති - 1 වැනි කාණ්ඩයෙහි 256 වගන්තියෙහි සඳහන් විධිවිධාන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, දුක්ගැනවිලි හෝ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ මත, වාර්ෂික ස්ථාන මාරු තීරණ නියමිත දිනෙන් පසුවට කල් දමනු නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

07. තවද, ඉහත පළමු ඡේදයෙහි සඳහන් ස්ථාන මාරුවීම් පිළිබඳව විස්තර අමාත්‍යාංශයේ https://moe.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

නාලක කළුවැව
ලේකම්

**පිටපත් :**

1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.
2. සියලුම අතිරේක ලේකම්වරු
3. ප්‍රධාන මූල්‍ය නිලධාරි (I/II)
4. අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
5. ජාතික පාසල් අධ්‍යක්ෂ
6. විද්‍යාපීඨ කොමසාරිස්
7. සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

(2–7) - කරු. අවශ්‍ය කටයුතු සඳහා